# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1978/32 – 2016 අගෝස්තු මස 05 වැනි සිකුරාදා – 2016.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම් පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩ පත්තුව සුළු කොට්ඨාසයේ, කඹුරුපිටිය ගමේ පිහිටි, සර්වේයර්ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එම්ආර්/කේඑම්බී/2014/698 හා 2015.05.06 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1012 ක් පමණ වන ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – රටලංකාව වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0996**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන රටලංකාව වත්ත; නැගෙනහිරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන රටලංකාව වත්ත; දකුණට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන රටලංකාව වත්ත, මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ කැබලි අක්ෂර බී; බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ කැබලි අක්ෂර බී.

02. **කැබලි අක්ෂර 'බී' – රටලංකාව වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0016**

උතුරට සහ නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ; දකුණට: කැබලි අක්ෂර ඒ සහ මාර්ගය (ප්‍රාදේශීය සභාව); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ කැබලි අක්ෂර ඒ.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2014/එල්/301.
2016 ජූනි මස 06 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 533



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*